**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය - 2023**

----------------------------------------------------------------------------------------------------

විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක.9186-එස්ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතුයයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ප්‍රදාන සහ ව්‍යාපෘති ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු පලාතේ යාපනය ප්‍රදේශයේ කුඩා හුදකලා දූපත් 03 (නයනතිව්, අනලතිව් හා එළුවතිව්) තුල වූ ග්‍රාමීය ප්‍රජාව සඳහා එළදායී බලශක්ති භාවිතයට සහය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. බාහිරව මුදල් යෙදවීමට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර වූ ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 288 කට සමාන එජඩො මිලියන 2 ක් වන එම මුදල ආසියානු සංවර්ධන බැංකුව විසින් පරිපාලනය කරනු ලබන දරිද්‍රතාවය අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2017 මාර්තු 19 දින ආරම්භ කර ඇති අතර 2021 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2024 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | බල මුළු ගැන්වීමේ අත්තිකාරම් (Mobilization Advance) මුදල් රු. මිලියන 10ක ප්‍රමාණය ආවරණය කර ගැනීම සිදුකර තිබූ නමුත් අත්තිකාරම් මුදල් ආවරණය කර ගැනීමට අදාල මූල්‍ය ප්‍රකාශන ගැලපීම් සිදු නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට සිවිල් වැඩ (Civil works) ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් ඌණ තක්සේරු වී තිබූ අතර බලමුළු ගැන්වීමේ අත්තිකාරම් (Mobilization Advance) ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අධිතක්සේරු වී තිබුණි. | සිවිල් වැඩ ගිණුමට රු. 5,710,025 ක් සහ රුපියල් 4,380,388 ක් හර කර ඇති අතර බලමුලු ගැන්වීමේ අත්තිකාරම් ගිණුමට රු. 5,710,025 ක් සහ රුපියල් 4,380,388 ක් බැර කර 2024 වර්ෂයෙදී එය නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගය සඳහන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් දෙකකට අදාළව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදලින් රුපියල් මිලියන 1.2 ක මුදලක් රඳවා ගැනීමේ මුදල් ලෙස අඩු කර ඇත. කෙසේ නමුත් ඊට අදාල ලෙජර ගැලපීම් සිදුකර නොතිබීම හේතුවෙන් සිවිල් වැඩ ගිණුමේ ශේෂය හා රඳවා ගැනීම් මුදල් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් ඌණ තක්සේරු වී තිබුණි. | 2024 වර්ෂයෙදී එය නිවැරදි කරන බැවින්, ව්‍යාපෘතිය ඒ අනුව 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය සකස් කර ඉදිරිපත් කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගය සඳහන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය යටතේ එක් එක් කොන්ත්‍රාත්/සැපයුම්කරුවන්ට ගෙවා තිබූ වැට් බදු මුදලින් වටිනාකම රුපියල් මිලියන 3.5 ක් වූ වැට් බදු මුදල් 2023 වර්ෂයතුළදී මණ්ඩලය විසින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වැට් බදු මුදලින් අඩු කර ගැනීම (Input VAT Claim) සිදුකර තිබුණි. කෙසේ නමුත් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන තුල ඊට අදාල ගැලපීම් සිදුකර නොතිබීම හේතුවෙන් සිවිල් වැඩ ගිණුමේ ශේෂය හා ශ්‍රී ලංකා රජයෙ මූල්‍යාන (GOSL Imprest) ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අධිතක්සේරු වී තිබුණි. | ඉදිරිපත් කළ ආදාන වැට් බදු හිමිකම්වලට අනුව මණ්ඩලය විසින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වැට් බදු මුදලින් රුපියල් 3,495,146.73ක් අඩු කර ගැනීම (Input VAT Claim) සිදුකර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගය සඳහන් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.** **භෞතික කාර්ය සාධනය.**

**3.1** **ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| **ව්‍යාපෘති සංරචකය** | **ක්‍රියාකාරකම** | **2023 දෙසැම්බර් 31 දිනට** | | **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|---|---|---|---|
| | | **ප්‍රසම්පාදනයේ අපේක්ෂිත භෞතික කාර්ය සාධනය** | **ප්‍රසම්පාදනය විසින් ළඟා කරගෙන ඇති කාර්ය සාධනය** | | | |
| | | **ප්‍රතිශතය** | **ප්‍රතිශතය** | | | |
| දිනකට ටොන් 2 ක අයිස් සෑදීමේ කර්මාන්ත ශාලාවක් සහ ශීතකරණ පද්ධතියක් ඉදිකිරීම. | _ | 100 | 0 | විදුලි සැපයුමක් නොමැතිකම හේතුවෙන් අයිස් නිෂ්පාදන කර්මාන්ත ශාලාව සහ ශීතකරණ පද්ධතිය ඉදිකිරීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අත්හිටුවා ඇත. මේ නිසා මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අයිස් කර්මාන්ත ශාලාවෙන් මේ දූපත් තුනේ ධීවර ප්‍රජාවට ලබාදීමට බලාපොරොත්තු වූ ප්‍රතිලාභ අහිමි වී තිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් බලශක්ති පද්ධතිය නොමැතිකම හේතුවෙන් අයිස් කැට නිපදවන බලාගාරය ක්‍රියාත්මක කිරීමට නොහැකි වන අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාලනයෙන් තොර වේ. | සැලසුම් කළ පරිදි වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |